# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2105/46 - 2019 ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* කේඩීඑස්/පීබීකේ/4/4/17.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* එල්ඩී/05/2004/එච්ඩබ්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ කෝරළේ සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංකඃ 1104 පල්ලේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පල්ලේගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් 2015.05.29 වැනි දින සකස් කර ඇති මූලික පිඹුරු අංක මහ 6426 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0229ක් වූ කැබලි අංක 01 දරන ඉඩමේ මායිම්:

1. කැබලි අංක. 01

ඉඩමේ නම: ගල්ලඹුදෙනිය; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සුනේත්‍රා කුමාරි උතුවන, අංක 236/9, දොලොස්බාග පාර, නාවලපිටිය (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ අත්කර ගන්නා ලදී); ප්‍රමාණය: හෙක්. 0.0229.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.02.25 දින පෙ.ව. 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019.02.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පස්බාගේ කෝරළේ,
ප්‍රාදේශීය ලේකම්.

පස්බාගේ කෝරළේ,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

01-649